# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

සජීව විජේවීර
185 ඒ
ආරච්චිකන්ද
හපුගල
වක්වැල්ල

**අභියාචක**

එදිරිව

**අභියාචනා අංකය :**
**RTIC/Appeal/1487/2022**

ශ්‍රී ලංකා ටෙලිකොම්
කොළඹ 01

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
5. ඒ.එම්. නහියා - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක සූම් තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වේ.

පොදු අධිකාරිය වෙනුවෙන් සාමාන්‍යාධිකාරි / තොරතුරු නිලධාරි ජේ. වර්ණකුලසූරිය මිය සහ නීති නිලධාරි රජිතා ද සිල්වා මෙය පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - 11.05.2023

පොදු අධිකාරිය - 21.03.2023

**විභාග කළ දිනය :** 2023.03.28, 2023.05.31

**තීරණය කළ දිනය :** 2023.05.31

**කොමිෂන් සභාවේ තීරණය**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2022.11.02 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

*ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී ආයතනය හෝ එස්.එල්.ටී මොබිටෙල් ආයතනය යන ආයතන මගින් සපයනු ලබන අන්තර්ජාල සේවා ලබාදීමේදී පිවිසිය නොහැකි වන සේ හා/ හෝ*

*පිවිසීමට බාධා වන සේ බාධා පමුනුවන ලද හා/හෝ අවහිර කරන ලද වෙබ් අඩවි , ඩොමේන් නාම,අයි.පී ලිපින, ඊමේල් හෝ වෙනත් අයිතම පිලිබද පහත සදහන් විස්තර අවශ්‍ය කර තිබේ.*

| *අයිතමයේ වර්ගය (වෙබ් අඩවි, ඩොමේන් නාම, ඊමේල්, IP ලිපින වශයෙන්)* | *අයිතමය (වෙබ් අඩවිය, ඩොමේන් නාමය, ඊමේල් ලිපිනය, IP ලිපින් වශයෙන්* | *අවහිර කළ/ බාධා පැමිණ වූ දිනය* | *අවහිරයේ / බධා කිරීමේ ස්වභාවය* | *ාවහිර කිරීමට/ බාධා පැමිණවීමට හේතුව* | *එසේ බාධා කරන ලද්දේ/ අවහිර කරන ලද්දේ කවර හේතුවක් මතද යන්න* | *අවහිරය/බාධාව කරන ලෙස නියෝග කල හෝ තීරණය කළ ආයතනය සහ බලය ලත් තැනැත්තා* |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

මෙම තොරතුරු ඉල්ලීමට තොරතුරු නිළධාරී විසින් 2022.11.24 වන දින පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*මේ තොරතුරු ඉල්ලීම පිළිබඳව ඔබට අවශ්‍ය තොරතුරු විදුලි සංදේශ නියාමන කොමිසම මගින් ලබා දුන් බවට අපව දැනුවත් කර ඇත.*

මෙම පිළිතුරෙන් අතෘප්තියට පත් අභියාචක 2022.11.24 දිනැතිව නම්කළ නිළධාරි වෙත අභියාචනයක් යොමු කර ඇති අතර නම්කළ නිළධාරි විසින් 2022.12.22 වන දින පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරු අංක 2016/ 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ 5 (1) (a ) හෝ 5(1) (b) හෝ 5(1) (g) හෝ5(1) (h) හෝ 5(1) (i) 5(1) (j) වගන්ති වල ප්‍රතිපාදන වලට අනුව ලබා දිය නොහැකි බව දැනුම් දෙමි.*

මෙම පිළිතුරෙන් අතෘප්තියට පත් අභියාචක 2022.12.23 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

පොදු අධිකාරිය විසින් 2023.03.21 වන දිනැතිව සිය ලිඛිත දේශන මගින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

*i.* *100% of shares of Mobitel Pvt Ltd is currently held by the Respondent. Thus Mobitel Pvt Ltd is not a Public Authority according to the definition of the RTI Act and does not come under the purview of the RTI Act.*

*ii.* *That the requested information is exempted information under sections 5(1)(a), 5(1)(b)(i), 5(1)(g), 5(1)(h), 5(1)(i), 5(1)(j) and 5(1)(n) hence Telecommunication Regulatory Commission of Sri Lanka only informs the internet service providers temporary block, website/websites based on an order issued by the Court, or Women and Children Protection Authority, or upon a directive given by Ministry of Defence, or upon request made by ministry of Media and Election Commission.*

*Aforementioned orders directives are submitted to TRCSL by third parties*

අභියාචක විසින් 2023.05.11 වන දිනැතිව සිය ලිඛිත දේශන මගින් මේ තොරතුරු ඉල්ලීම පිළිබඳව අවශ්‍ය තොරතුරු විදුලි සංදේශ නියාමන කොමිසම මගින් ලබා දුන් බවට වන ප්‍රකාශය අසත්‍ය බවත් 2023.05.10 දක්වාම එවැනි තොරතුරක් විදුලි සංදේශ නියාමන කොමිසම විසින් අභියාචක වෙත නිකුත් කර නොමැති බවත්, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පොදු අධිකාරියක් නොවන බවට ප්‍රකාශ කිරීම සාවද්‍ය සහ නොමග යවනසුළු ප්‍රකාශයක් වන බවත් දක්වා ඇත.

**සළකා බැලීම**

මෙම අභියාචනය සම්බන්ධයෙන් පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත සැළකිරීම් සහ අද දින සිදු කරන ලද වාචික සැළකිරීම් සළකා බලන ලදී. පොදු අධිකාරියේ මෙම තොරතුරු මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා 2016 අංක 12 දරණ පනතේ 5 (1) (a), 5 (1) (b) (i), 5 (1) (g), 5 (1) (h), 5 (1) (i), 5 (1) (j) සහ 5 (1) (n) වගන්ති ආදේශ කරගෙන ඇති බවට ඔවුන්ගේ ලිඛිත සැළකිරීම් වල දක්වා ඇත. මෙම වගන්ති සියල්ලම තොරතුරු මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා ඉහත සඳහන් වගන්ති ආදේශ කර ගැනීම තුළින්ම තොරතුරු මුදා හැරීම පිළිබඳව හා තොරතුරු මුදා නොහැරීම පිළිබඳව පොදු අධිකාරියකට ක්‍රියා කිරීමට ඇති නෛතික අයිතිවාසිකම පිළිබඳව ඇති නොදැනුවත්භාවය ප්‍රදර්ශනය වේ. ඉහත සඳහන් එකදු වගන්තියක් හෝ මෙම තොරතුරු මුදා නොහැරීමට අදාළ කරගත නොහැක.

මෙම කොමිෂන් සභාව විසින් රයිසා වික්‍රමතුංග එදිරිව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව RTIC/Appeal (in person) 106/2018 අභියාචනා විමසීමේදී වර්තමාන අභියාචනයට අදාළ තොරතුරු ඉල්ලීම් වලට සමාන තොරතුරු ඉල්ලීමක් විමර්ශනය කිරීමෙන් අනතුරුව එසේ බාධා කරන ලද හෝ තහනම් කරන ලද හෝ වෙබ් අඩවි සම්බන්ධව පොදු අධිකාරිය විසින් තොරතුරු මුදා හැරිය යුතු බවට තීරණය කර ඇත. එකී තීරණය අභියෝගයට ලක් නොවී ඇති අතර එය තවමත් බලයේ පවතී.

වර්තමාන අභියාචනයට අදාළ තොරතුරු ඉල්ලීමද ඒ අනුව සමාන තොරතුරු ඉල්ලීමකට අදාළ කරුණු වන බැවින් ඉහත කී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා තීරණයෙන් වෙනස් වන තීරණයකට එළඹීමට මෙම කොමිෂන් සභාවට හැකියාවක් නොමැත.

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පොදු අධිකාරියක් නොවන බවට ඔවුන්ගේ ලිඛිත සැළකිරීම් වලින් කරුණු දක්වා ඇත. මෙම අභියාචනයට අදාළ තොරතුරු ඉල්ලීම සළකා බැලූ පොදු අධිකාරියේ තොරතුරු නිලධාරී හෝ අභියාචනය සළකා බැලූ පොදු අධිකාරියේ නම් කළ නිලධාරී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පොදු අධිකාරියක් නොවේ යන ස්ථාවරයට එළඹ නොමැති අතර ඔවුන් දෙදෙනාම තොරතුරු මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා ඉහත කී 5 (1) (a), 5 (1) (b) (i), 5 (1) (g), 5 (1) (h), 5 (1) (i), 5 (1) (j) සහ 5 (1) (n) වගන්ති පමණක් අදාළ කරගෙන ඇත.

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙහි කොටස් හිමිකාරිත්වයෙන් 49% ක් රජය සතු වේ. කරුණු එසේ වුවත්, ලිඛිත සැළකිරීමෙහි පොදු අධිකාරිය සඳහන් කර ඇත්තේ ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනයේ කොටස් හිමිකාරිත්වයෙන් 100% ම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හිමිකාරිත්වය දරණ බැවින් ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනය පොදු අධිකාරියක් නොවන බවත් ඒ හේතුවෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පොදු අධිකාරිය වශයෙන් මෙම තොරතුරු මුදා හැරීමට බැඳී නොමැති බවත්ය.

මෙම තොරතුරු ඉල්ලීම ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනය වෙත යොමු කර නොමැත. අභියාචක තම තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙතය. එබැවින් ශ්‍රී ලංකා ටෙලිකොම් සහ ශ්‍රී ලංකා මොබිටෙල් අතර ඇති සම්බන්ධය ඉහත කී තොරතුරු ඉල්ලීමට අදාළ නොවේ.

එය එසේ වුවත්, ශ්‍රී ලංකා මොබිටෙල් යනු කොටස් හිමිකාරිත්වයෙන් 100% ම ශ්‍රී ලංකා ටෙලිකොම් සතු සමාගමකි. ඒ අනුව ශ්‍රී ලංකා මොබිටෙල්, ශ්‍රී ලංකා ටෙලිකොම් යටතේ නිර්මාණය වී ඇති ඊට අනුබද්ධිත ආයතනයකි. එම බැඳීම රජය 49%ක කොටස් හිමිකාරිත්වය දරණ ශ්‍රී ලංකා ටෙලිකොම් තුළින් රාජ්‍ය තන්ත්‍රය තුළට ගැනෙන සමාගමක් බවට පත් වේ. ඒ අනුව 2016 අංක 12 දරණ පනතේ අර්ථනිරූපණය තුළ ශ්‍රී ලංකා මොබිටෙල් ද පොදු අධිකාරියක් බවට පත් වේ.

එබැවින්, ඉහත කරුණු මත පොදු අධිකාරිය ඉදිරිපත් කරන පොදු අධිකාරියක් නොවේ යන තර්කය හා එකඟ වීමට මෙම කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. එබැවින් ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති සියලුම තොරතුරු 2023.07.04 වන දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරියේ ආයතන ප්‍රධානී, සභාපති මහේෂ් අතුකෝරළ මහතා සහ එහි තොරතුරු නිලධාරි සාමාන්‍යාධිකාරි ජේ. වර්ණකුලසූරිය මහත්මිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවටද වැඩිදුරටත් තීරණය කරමු.

එසේම, “2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති (ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටිය)” රීති මාලාවේ 11 වන රීතිය යටතේ උක්ත තොරතුරු මුදා හැරීමේදී පොදු අධිකාරියට ගාස්තු අය කිරීමේ හැකියාව නොලැබෙන බවද මෙහිලා වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.